

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/ පෙළ) විභාගය -2026 පෙරහුරු පරීක්ෂණය

13 ශ්‍රේණිය		නැටුම් (දේශීය) - I	52 S I	කාලය - පැය 02 යි

විශේෂ උපදෙස් :

- සියළුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුයි.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.
- අංක 01 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදි වඩාත් නිවැරදි හෝ ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

01.දළුමුර හෙවත් බුලත් යාගකරණයේදි බෙහෙවින් යොදා ගනි.ඒ අනුව දළුමුර පදය දක්නට ලැබෙන සම්ප්‍රදාය වන්නේ,

1)උඩරට
2) පහතරට
3) ද්‍රවිඩ
4) සබරගමු
5) නුවර කලාවිය

( )

02.කුංදිං තත් දොංතක තරිකිට .. යන බෙර පදය අයත් තාල රූපය වන්නේ

1) මාත්‍රා 2+ 2+2+ 4+4
2) මාත්‍රා 2+2+2+3+3
3) මාත්‍රා 2+ 2+ 4
4) මාත්‍රා 2+ 2+ 3+4
5) මාත්‍රා 3+4

( )

03. සිරස බඳින ජටා සතර පළමු ලේ විලේ - සරොස වෙමින් බලා සිටිති සොහොන් දඩු පලේ...
යන කවිය අයත් චරිතය වන්නේ

1)කළු යකා ය
2) අභිමාන යකාය
3) රිරි යකාය
4) මහසොහොන් යකා
5) ගරා යකා

( )

04.පාරම්පරික සම්මත ක්‍රම අනුව භාණ්ඩ සකස් කිරීමේදි හඬ ඉර සහ නියඳ කෙදි භාවිතා කර ඇත්තේ

1) ගැටබෙරය හා දවුල වාදන භාණ්ඩ සඳහාය
2) උඩැක්කිය හා දවුල වාදන භාණ්ඩ සඳහාය
3) දෙවොල් බෙරය හා දවුල් බෙරය සඳහාය
4) උඩැක්කිය හා ගැටබෙරය වාදන භාණ්ඩ සඳහා
5) ගැටබෙරය උඩැක්කිය වාදන භාණ්ඩ සඳහා

( )

05) අභිනව ගුප්ත ආචාර්යයන් භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථයට සපයන ලද ටීකාව වන්නේ,

1) සංගීත රත්නාකරය
2) අභිනව භාරති
3) අමරකෝෂය
4) නෙර්තමාලය
5) නෘත්‍යරත්නාකරය

( )

06) දේශිය තාල පද්ධතියේ මෑදුම් තනි තිත්තේ තාල රූපයට සමානකම් දක්වන කර්ණාඨක තාල පද්ධතියේ තිශ්‍ර ජාති ඒක තාලය වන්නේ

1) ත කි ට ත කි ට
2) ත ක දි මි ත ක දි මි
3)ධ ගෙ න දි න ක ධි න
4) ධි නා ධි ධී නා තී නා ධි ධි නා
5) ත කි ට ත ක දි මි ත කි ට ත ක දි මි

( )

Past Papers Wiki

07) කිරිමඩුව ශාන්තිකර්මය හා වලියක් මංගල්‍ය විමසුම යන ග්‍රන්ථ රචනා කළ ශිල්පීන් වන්නේ,

1) ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය හා මුදියන්සේ දිසානායක මහතා
2) ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය හා ලයනල් බෙන්තරගේ මහතා
3) ජයසේන කෝට්ටගොඩ මහතා හා ජේ.ඊ් සේදරමන් මහතා
4) මුදියන්සේ දිසානායක මහතා හා යසේන කෝට්ටගොඩ මහතා
5) තිස්ස කාරියවසම් මහතා හා ශ්‍රියානි රාජපක්ෂ මහතා ( )

08) බ්‍රහ්මණ්ඩේ කවි සන්න කොටස් කිරිම කඩතිර කවි කීම අටමගල පැගවීම ... යන චාරිත්‍ර ඇතුලත් වනුයේ

1) බලි ශාන්තිකර්මයේ
2) රටයකුම ශාන්තිකරමයේ
3) සන්නියකුම ශාන්තිකර්මය
4) වලියක් මංගල්‍ය
5) කිරිමඩුව ශාන්තිකර්මයේ ( )

09) දෙඅතින් නරුපට අල්ලාගෙන සමනලයකු තටු සලන අයුරු අනුකරණය කළ නර්තන ශිල්පියා හා එම වන්නම වන්නේ

1) ශ්‍රී වන්ද්‍රරත්න මානවසිංහ මහතා සමනල වන්නම
2) ප්‍රේමකුමාර එපිටවෙල මහතා හංස වන්නම
3) නිත්තවෙල ගුණයා මහතා හා සමනල වන්නම
4) ජයසේන කෝට්ටගොඩ මහතා හා මහාබෝ වන්නම
5) නිත්තවෙල ගුණයා මහතා හා හංස වන්නම ( )

10) ශාන්ත රසය මතු කෙරෙන ගායනා විශේෂයක් වන්නේ,

1) උඩැක්කි
2) ග්‍රහපංති
3) පන්තේරු
4) ප්‍රශස්ති
5) සිරසපාද ( )

11) හංසවිල නිදිකුමරිය හා ද නට් ක්‍රැකර් වැනි ලොව ප්‍රකට බැලේ නිර්මාණ සඳහා සංගීතය හා රංග වින්‍යාසය සිදු කරනු ලැබුවේ

1) පීටර් චෛකොයිස්කි හා ජීන් ජෝර්ජ් නෝර්වේ
2) පීටර් චෛකොයිස්කි හා මාරියාස් පෙටීපා
3) 14 වන ලුවී රජු හා ජීන් බැප්ටිස් ලිලි
4) පියරේ බියුචැම් හා ජීන් ජෝර්ජ් නෝර්වේ
5) මයිකල් පෝර්කින් හා ඇනා පැව්ලෝවා ( )

12) දක්ෂිණ භාරතීය කර්ණාඨක සංගීත සම්ප්‍රදායෙහි තාල ශාස්ත්‍ර ගොඩ නැගී ඇත්තේ

1) ජාති 5 හා තාල 8 ක් මත
2) ජාති 5 හා තාල 6 ක් මත
3) ජාති 8 ක් හා තාල 7 ක්මත
4) ජාති 5 ක් හා තාල 7 ක්මත
5) ජාති 7 ක් හා තාල 5 ක් මත ( )

13) සුර සමඟ එක් වුන - සිටුවා නොයෙක් ලක්ෂණ .. මෙම කෙටි කවිය භාවිතා කරන්නේ

1) උඩැක්කි උපත සම්බන්ධ කෙටි කවියකි
2) තම්මැට්ටම් උපත පිළිබඳ කවියකි
3) දවුල නිර්මාණයේදී භාවිතා කරන කවියකි
4) යක් බෙරය උපත හා සම්බන්ධ කවියකි
5) ගැටබෙරය උපත හා සම්බන්ධ කවියකි ( )

14) භරත නාට්‍යම් සම්ප්‍රදාය තුළ නෘත්ත ගණයට අයත් සහා ප්‍රවීණ භරත නාට්‍යම් ශිල්පි පොන්නයියා විසින් හඳුන්වා දුන් නර්තන අංගය වන්නේ

1) අලාරිප්පු
2) තිල්ලානා
3) වර්ණම්
4) ජතීශ්වරම්
5) ශබ්දම් ( )

15) රළලා උපුලා ලෙලුම තුළායා - නෙතලා බැමලා බමවාලායා ... යන කවියෙහි තාලය හා රිද්මය අනුව නර්තනය සිදු වන අයුරු විස්තර කළ සංදේශය හා යුගය වන්නේ,

1) තිසර සංදේශය - ගම්පළ යුගය
2) සැළලිහිණි සංදේශය -කෝට්ටේ යුගය
3) මයුර සංදේශය - ගම්පළ යුගය
4) මයුර සංදේශය - කෝටටේ යුගය
5) පරෙවි සංදේශය - කෝට්ටේ යුගය ( )

16) පහන් මඩු ශාන්තිකර්මයේදි භාවිතා කරන ලද ප්‍රධාන සැරසිලි ඇතුළත් වරණය වන්නේ

1) පත්තිනි තොරණ , පූනා වීදිය කුමාර වීදිය
2) අයිලය , පත්තිනි තොරණ, සූනියම් වීදිය
3) පත්තිනි තොරණ , පත්තිරිප්පුව,කුමාර වීදිය
4) දෙවොල් තොරණ , සූනියම් වීදිය,පත්තිනි තොරණ
5) කුමාර වීදිය, දෙවොල් තොරණ , සූනියම් වීදිය ( )

17) වේදිකාවේ එක්තරා ප්‍රදේශයක් එක් ස්ථානයක් පුද්ගලයකු ආලෝකය මගින් වෙන් කර දැක්වීමට භාවිතා කරන පහන් වර්ගය වනුයේ

1) ස්ට්‍රොබ් පහන
2) ආලෝක තීව්‍රතා පාලනය
3) අල්ට්‍රා වයලට් පහන
4) ධාරා පහන
5) යොමු පහන් ( )

18) පහන් දැලි හෝ අඟුරු පොල්තෙල් සමග මිශ්‍රව කරන ලද කළු ආලෝකය සහිත වර්ණය භාවිතා කරන ලද වරිතය වන්නේ

1) මරු සන්නිය
2) මුදලි කෝළම
3) රිරි යකා
4) ජස කෝළම
5) ගුල්ම සන්නිය ( )

19) ශාන්තිකර්ම පරිසරයෙන් පරිභාහිරව කාන්තා රංගවස්ත්‍රාභරණ නිර්මාණ කලාවක් ගොඩ නැගීමට පුරෝගාමී වූ පුද්ගලයා වන්නේ

1) ලයනල් අල්ගම මහතා
2) සෝමබන්දු විද්‍යාපති මහතා
3) එස් පණිහාරත මහතා
4) ප්‍රේමකුමාර එපිටවෙල මහතා
5) චිත්‍රසේන මහතා ( )

20) මිනිස් කටහඬට ඉතා සමීප බවක් නිකුත් වන සහ කුහර සහිත ලී කඳකට සමක් ආවරණය කර සකස් කරන ලද වාද්‍ය භාණ්ඩයක් වනුයේ

1) මෘදංගය
2) පක්වාජ්
3) සාරංගිය
4) වීණාව
5) තබිලාව ( )

21) සන්නියකුම් ශාන්තිකරිමයේදි සමයම් පද නැටීමේදි හා යක්ෂ චරිත ඉදිරිපත් කිරිමේදි ස්මතු වන රසය වන්නේ,

1) රති
2) හාස්‍ය
3) බීබත්ස්‍ය
4) භයානක
5) වීර ( )

22) ලී කෙළි නැටුමේදි ගායනය කරන කවි අතර අංගම් සටන්කරුවන් තම ආරක්ෂක දෙවි ලෙස විශ්වාස කරන ලද්දේ

1) කතරගම දෙවියන්
2) කාලි දෙවියන්
3) විෂ්ණු දෙවියන්
4) පත්තිනි
5) අයියනාර් දෙවියන් ( )

23) රිද්දියාගයේදි භාවිතා කරන ලද ප්‍රධාන සැරසිල්ල වනුයේ

1) වටකුමාර වීදිය
2) දහඅට පාලි තොරණ
3) කත්තිරික්ක
4) මල් මඩුව
5) කපාල කුඩුව ( )

24) වලියක් මංගල්‍යෝත්සවයේදී ඉදිරිපත් නොකරන ලද නාට්‍යමය පෙළපාලියකි

1) ගරායකුන් නැටීම
2) ගුරුගේ මාගාව
3) ඌරා යක්කම
4) දොගර ජිං ගජිගත වට්ටම
5) කාලි යාම

( )

25) අතීතයේදී හාතා යක්කම නැමති පෙළපාලි අංගය ඉදිරිපත් කළ සම්ප්‍රදාය හා ඒ සඳහා භාවිතා කළ වාද්‍ය භාණ්ඩය වන්නේ

1) සබරගමු - උඩැක්කිය
2) උඩරට - උඩැක්කිය
3) සබරගමු - දවුල
4) පහතරට - තම්මැට්ටම
5) පහතරට - උඩැක්කිය

( )

අංක 26 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න

26) ස්ථායිභාව අවධි කිරීමට ..... මුල් වේ.

27) රජයේ කලායතනයේ නර්තන අධ්‍යාපනය ආරම්භ වූ වර්ෂය වනුයේ ..... ය.

28) සොළොස්මහල සැරසිල්ල අයත් වන්නේ ..... ශාන්තිකර්මයටය.

29) කැලැමල් ගීත නාට්‍යය .....මහතාගේ නිර්මාණයකි.

30) මෝල්ගස් නැටුම වේදිකාවට ගැළපෙන ලෙස ..... මහත්මිය විසින් නිර්මාණය කරන ලදි.

31) රෙදිපාන්කඩ ඔතා ඊට පොල්තෙල් පොගවා දල්වනු ලබන කුඩා පන්දම් ..... ලෙස හැඳින්වේ.

32) කථක් නර්තන සම්ප්‍රදායේදී ඇතාගේ හරබර වූ ස්වභාවය අනුව නටනු ලබන පරන් වර්ගය ..... වේ.

33) ගෞතම බුදුන් බුදු වීමට පෙර විවරණ ලබා ගැනීම හා සම්බන්ධ කරුණු ඇතුළත් කරමින් විහාර ආශ්‍රිතව ගොඩනැගුණු කවි විශේෂයක් ලෙස ..... කවි හැඳින්වේ.

34) ලොව ප්‍රථම ස්ථිරවම ගොඩනගන ලද එළිමහන් රංග භූමිය ලෙස ..... හැඳින්වේ.

35) ප්‍රේක්ෂකයා තුළ සන්ත්‍රාසය හා අධික කුතුහලය වැනි චිත්තවේග අවධි කිරීමට භාවිතා කරන පහන් වර්ගය ..... ලෙස හඳුන්වයි.

අංක 36 සිට 50 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

36) තබ්ලාව බිහි වූ සියවස හා එය නිපදවූ සංගීතඥයා නම් කරන්න

....

37) උඩැක්කි කවි ගායනයේදී වාදනය කරන බෙර පදය හා උඩැක්කිය අලංකාර කර ගැනීමට යොදා ගන්නා පටිය හඳුන්වන නම කුමක්ද?

....

38) සන්නියකුමේ යාගයේදී ප්‍රධාන රංග මණ්ඩපය හඳුන්වන නම් දෙකක් ලියන්න

....

39) කථක් නර්තන සම්ප්‍රදායේ එන මොට්ටක්කිලිය හා කරණ්තුල් යන ආභරණ පළඳින ස්ථාන නම් කරන්න

මොට්ටැක්කිලි..... කරන්තුල්.....

40) ශ්‍රී ලංකාවේ ප්‍රථම අංග සම්පූර්ණ ප්‍රොසීනියම් ආරුක්කු සහිත වේදිකාව බිහි වූ වර්ෂය හා රඟහල නම් කරන්න

වර්ෂය ..... රඟහල.....

41)බැරිසිල් මුද්‍රා නාට්‍යයේ පසුතල නිර්මාණය හා රංග භූමි ආලෝකකරණය කළ ශිල්පීන් නම් කරන්න

....

42) බුදසිරු කුමරු පිළිබඳ කතාපුවත සම්බන්ධ ශාන්තිකර්මය හා එය අයත් නර්තන සම්ප්‍රදාය නම් කරන්න

ශාන්තිකර්මය ..... සම්ප්‍රදාය .....

43) කාවඩිය මඟින් සංකේතවත් කෙරෙන කඳු දෙක නම් කරන්න

....

44)



A



B

ඉහත A හා B රූපවලින් දැක්වෙන වාද්‍යභාණ්ඩ දෙක නම් කරන්න

A ..... B .....

45) නවීන අංග රචනා ක්‍රම දෙක ලියන්න

....

46) සිංහල නිත් තාල ක්‍රමය හා තාල ඥානය යන කෘතීන් රචනා කළ කතෘවරු නම් කරන්න

....

47) දේශීය සරල ගී තුළ උකුසා වන්නමේ හා සුරඹා වල්ලිය නර්තනයේ ආභාෂය ලැබූ ගීත දෙක නම් කරන්න

උකුසා ..... සුරඹා වල්ලිය.....

48) කථකලි නර්තනයේ ක්‍රිෂ්ණාට්ටම් හා රාමනාට්ටම් රචනා වී ඇත්තේ කුමන භාෂාවකින්ද?

ක්‍රිෂ්ණාට්ටම් ..... රාමනාට්ටම් .....

49) සාම්ප්‍රදායික නිත් ක්‍රමයේදි සුළු තිනි නිත අඩ නිත ලෙස හැදින්වූ අතර මැදුම් තනි නිත හා මහා තනි නිත හඳුන්වන නම් කරන්න

මැදුම් තනි නිත ..... මහා තනි නිත .....

50) උගෙ කාරිය ඌ පොල් පැල වනසනවා ... යන ගායනය ඇතුළත් ශාන්ති කර්මය හා නාට්‍යමය අවස්ථාව ලියන්න

ශාන්තිකර්මය ..... නාට්‍යමය අවස්ථාව .....

PAST PAPERS WIKI

***

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/ පෙළ) විභාගය -2026 පෙරහුරු පරීක්ෂණය

13 ශ්‍රේණිය		නැටුම් (දේශීය) - II	52 S II	කාලය - පැය 03 යි

උපදෙස් :-

* **මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.**
* **I කොටසේ 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.**
* **II හා III කොටස් වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන අනිවාර්ය ප්‍රශ්න දෙකද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය.**
* **සෑම ප්‍රශ්නයකම (I) කොටසට ලකුණු 06 ක් ද (II) කොටසට ලකුණු 06 ක් ද (III) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් බැගින් හිමිවේ.**

I – කොටස

01. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

* තෙහිං තකු තෙහිං තකු තෙහිං පිං
ගත්තත් පිං තරිකිට
* දිත්තම් දිතකු දොම් දොම් තාම්
* කුඳත් තක්කිට තකට පිම්තකු

(ii) පහත සඳහන් කවි පද මහ තනිතිතට ප්‍රස්තාර කරන්න.

ඉන්ද්‍ර දිසාවට දිසාවට ඉඹුල් විමානෙට
ඉරු දෙවි අධිපති වන්නේ
රන් සිරි වස ගෙන සුරත දරාගෙන
තුරගකු පිට වැඩ ඉන්නේ

(iii) ගජගා වන්නමේ අඩව්ව හෝ කොණ්ඩනාච්චි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ අටකුරු ගාහක වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

02. දේශීය නර්තන ඉතිහාසය පිළිබඳ තොරතුරු අධ්‍යයනයේදී ලිඛිත හා පුරාවිද්‍යා මූලාශ්‍රය වැදගත් වේ.

(i) දඹදෙණි හා කුරුණෑගල යුගවල භාවිත වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු සාහිත්‍යය මූලාශ්‍රය දෙකක් ඇසුරෙන් දක්වන්න.

(ii) කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය දෙකක් ඇසුරෙන් එම යුගයේ නර්තන කලාව පැවති තත්වය පිළිබඳ විස්තර කරන්න.

(iii) දේශීය නර්තන කලාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රවර්ධනය වූ අවධියක් ලෙස 1970 හා 1980 දශක දෙක දැක්විය හැකිය. සාධක දෙකක් ඇසුරින් විමසන්න

II - කොටස

03. දේශීය නර්තන සම්ප්‍රදායන් වලට අයත් ශාන්තිකර්ම සුවිශේෂ අනන්‍යතාවයන්ගෙන් උපලක්ෂිත වේ

i. වලියක් මංගල්‍යයේ පුරාවෘත්තය හා පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

ii. සමාජ සාරධර්ම හා සහජීවනය වර්ධනය විය යුතු සන්නියකුම ශාන්තිකර්මයේ කතා පුවත් වලින් පිළිබිඹු වේ. විමසන්න

iii. කිරිමඩුව ශාන්තිකර්මය හා බැඳි සමාජ සාරධර්ම දෙකක් පිළිබඳ සාකච්ජා කරන්න.

04. i. ඇඳීමේ හා ඇඹීමේ කලාව ප්‍රධාන කරගන්නා ශාන්තිකර්මයක ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය වන ආකාරය උදාහරණ දක්වමින් ඉදිරිපත් කරන්න.

ii. ප්‍රකාශනය තීව්‍ර කිරීම සඳහා රංග වස්ත්‍රාභරණ යොදාගෙන ඇති ආකාරය සන්නියකුම ඇසුරෙන් විමසීමක් කරන්න.

iii. රටයකුම ශාන්තිකර්මයට අයත් නානුමුරය පෙළපාලි අංගයේ දක්නට ලැබෙන විශේෂතා, රංග භාණ්ඩ හා වස්ත්‍රාභරණ ඇසුරින් විමසන්න.

05. ගැමි නැටුම් හා නාටක මගින් තත්කාලීන ජන සමාජයේ පීවන රටාව විවරණය කරයි.

i. ගැමියන්ගේ පීවන රටාව පිළිබිඹු කිරීමට, ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්ෂණ මෙන්ම ඒ හා බැඳි ගායනා ප්‍රබලව හේතු වේ.'' විමසන්න.

ii. සිංහල හා ද්‍රවිඩ සංස්කෘතික සමානතා ගැමි නැටුම් ඇසුරෙන් සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.

iii. කෝලම් හා සොකරි නාටකවලින් එක් චරිතය බැහින් තෝරාගෙන එම චරිතවල සුවිශේෂ ලක්ෂණ ගායන, වාදන හා නර්තන ඇසුරින් විස්තර කරන්න.

III – කොටස

06. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) කොටස	(ආ) කොටස	(ඉ) කොටස
මෘදංගය	නිදි කුමරිය	14 වන ලුවී රජු
ආමද්ද	පටාචාරා	පීන් ජෝර්ජ් නෝවේ
තබ්ලාව	ශාප්මෝචන්	කැතරින් ඩී. මෙඩිසි
තෝඩායම්	ශාකුන්තලය	මහා පීටර් රජු

i. (අ) කොටස - කථක් නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංගය තෝරාගෙන විස්තර කරන්න.

ii. (ආ) කොටස - දේශීය මුද්‍රා නාට්‍ය කෘතිය තෝරාගෙන එහි රංග රචනය විමසන්න.

iii. (ඉ) කොටස - බැලේ නර්තන කලාව ප්‍රංශය දක්වා ව්‍යාප්තියට පුරෝගාමී වූ දෙදෙනා නම් කර එහි ප්‍රවර්ධනයට ඔවුන්ගේ දායකත්වය ලැබී ඇති ආකාරය අගයන්න.

Past Papers Wiki

07. "නූතන තාක්ෂණික මෙවලම් භාවිතය නිසා නර්තන කලාව වර්තමානයේ ජනප්‍රිය කලාවක් බවට පත්ව ඇත."

i. අංග රචනය, රංග වස්ත්‍රාභරණ හා ආලෝකකරණය ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

ii. "නර්තන කලාවේ නූතන ප්‍රවණතා කෙරෙහි ජනමාධ්‍ය රුකුලක් වේ." විස්තර කරන්න

iii. අද්‍යතන ප්‍රසංග නර්තනය සඳහා යොදාගන්නා චලනවල උචිත බව පිළිබඳ විග්‍රහ කරන්න.

08. දේශීය අනන්‍ය ලක්ෂණ ආකාරෂා කර ගනිමින් ප්‍රාසාංගික නර්තනාංග ඉදිරිපත් කිරීම සාධනීය ලක්ෂණයක් වේ.

i. නර්තන රංග රචනය සහ රංග වස්ත්‍රාභරණවල නූතන ප්‍රවණතා සාම්ප්‍රදායික නර්තනය කෙරෙහි බලපාන ආකාරය විමසුමට ලක් කරන්න.

ii. රංග භූමිය හා නූතන වේදිකාව අර්ථ කථනය කරන්න.

iii. සමාජ රුචිකත්වය නව නර්තන බිහිවීමේදී බලපා ඇති ආකාරය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පිළිතුරු

01 - 4
02 - 1
03 - 3
04 - 5
06 - 1
07 - 1
08 - 1
09 - 3
10 - 3
11 - 2
12 - 4
13 - 1
14 - 2
15 - 3
16 - 3
17 - 5
18 - 1
19 - 4
20 - 3
21 - 4
22 - 1
23 - 4
24 - 3
25 - 1

26 - විභාව
27 - 1953
28 - වලියක් මංගල්‍යය
29 - ජේමසිරි කේමදාස මහතා
30 - මිරැන්ඩා හේමලතා මහත්මිය
31 - විලක්කු
32 - හස්ති (ගජ් පරන්)
33 - සූවිසි විවරණ
34 - ග්‍රීසියේ එපිසෝර්ඩ්
35 - ස්ට්‍රෝබ් පහන (පරිභ්‍රමණමාන)
36 - 14 වන සියවස / අමීර් බුෂ්රුඑනනනන
37 - දොං ජිජී ගත / උඩැක්කි සවරම
38 - සංඛපාල විදිය / කපාල විදිය / සන්නියකුම් විදිය
39 - හිසට / කණට
40 - 1911 /මරදාන ටවර්
41 - මයුර හසන්ත මහතා / වසන්ත කුමාර
42 - කිරිමඩුව / සබරගමුව
43 - ශිවගිරි / සප්ත ගිරි
44 - මෘදංගය / සාරංගිය
45 - එයා බ්‍රෂ් / ප්‍රොස්තටික් මේකප්
46 - සරත් විජේවර්ධන මහතා / වින්සන් සෝමපාල මහතා
47 - රුක් අත්තන / පුන්සඳ රැට
48 - සංස්කෘත / මලයාලම්
49 - අඩනිත / තාල නිත
50 - කොහෝඹා කංකාරිය / උඟරා යක්කම

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank